කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
விவசாயத் திணைக்களம்
DEPARTMENT OF AGRICULTURE

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය
பீடைகொல்லி பதிவு அலுவலகம்
Office of the Registrar of Pesticides

අංක 1056, ගැටඹේ, තැ.පෙ. 49, පේරාදෙණිය 20400, ශ්‍රී ලංකාව
இல 1056, கெடம்பே, த.பெ.இல 49, பேராதனை 20400, இலங்கை
No. 1056, Getambe, P.O. Box 49, Peradeniya 20400, Sri Lanka

දුරකථන/தொலைபேசி/Telephone : (94)812388076/388135
ෆැක්ස්/தொலைநகல்/Fax : (94)812388135
ඊ මේල්/மின்னஞ்சல்/E-mail : pest@slt.lk
වෙබ්/மின்னஞ்சல்/Web : www.doa.gov.lk

මගේ අංකය / எனது எண் / My No: RP/VIII/A1

ඔබේ අංකය / உமது எண் / Your No:

දිනය / திகதி / Date: 15/11/2022

<u>චක්‍රලේඛ අංක RP/03/2022</u>

**සියළුම පළිබෝධනාශක බලයලත් නිලධාරීන් වෙත,**

**<u>"පළිබෝධනාශක විකිණීම සඳහා සහතිකය" වාර්ෂිකව නිකුත් කිරීම</u>**

2022 ඔක්තෝම්බර් මස 26 දින පැවැති පළිබෝධනාශක බලයලත් නිලධාරීන්ගේ වාර්ෂික සමුළුවේදී සාකච්ජා කළ පරිදි, ඉදිරියේදී "පළිබෝධනාශක විකිණීම සඳහා සහතිකය" නිකුත් කිරීමේදී පහත සඳහන් අයුරින් ක්‍රියා කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

- "පළිබෝධනාශක විකිණීම සඳහා සහතිකය" ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දිනදක්වා වලංගු වන ලෙස නිකුත් කිරීමට කටයුතු කරන්න.

- යම්කිසි වෙළඳසැලක් වසර තුනක් එක දිගට "පළිබෝධනාශක විකිණීම සඳහා සහතිකය" ලබාගෙන නැත්නම්, අලෙවිසැලේ නම දත්ත සමුදායෙන් (Data base) ඉවත් කිරීමට කටයුතු කරන්න.

- ඉන්පසු, එම අලෙවිසැල නැවත වරක් පවත්වා ගෙන යැමට ඉල්ලුම් කළ හොත් එය නව අලෙවිසැලක් ලෙස සළකා කටයුතු කළයුතු අතර, එහිදී කලින් අලෙවිසැලක් පවත්වාගෙන යෑම යන කාරණයට විශේෂත්වයක් නොදිය යුතුය.

- එමෙන්ම, නව වෙළඳසැලක් ආරම්භ කිරීමට අනුමැතිය දිය යුත්තේ පවතින වෙළඳසැල් ගණන ප්‍රමාණවත් නොවන්නේ නම් හා ASTA පුහුණුලාභියෙකු සිටීනම් පමණි.

- එහිදී අදාළ අයදුම්පත,පවතින ක්‍රමවේදයට අනුකූලව, ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයාගේ නිර්දේශය හා දිස්ත්‍රික් කමිටුවේ නිර්දේශය සමඟ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා වෙත එවීමට කටයුතු කරන්න.

මේ පිළිබඳව යම් ගැටළුවක් ඇත්නම්,කරුණාකර විමසීම් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්.එන්.එල්. රත්නවීර,
වැඩබලන පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්

පිටපත්:
1. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.ස.
2. අධ්‍යක්ෂ (බී. ජ. පැ. සං.) - කා.දැ.ස.